" සියළු හිමිකම් ඇවිරිණි "

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය - 2020
පුනරීක්ෂණ ප්‍රශ්න පත්‍ර මාලාව

සිංහල භාෂාව හා සාහිත්‍යය III © All Right Received www.learntv.lk කාලය: පැය 02

සැලකිය යුතුය:

I. උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
II. 1,2,3,4 ප්‍රශ්නවලටත් 5,6,7 ප්‍රශ්නවලින් **එකකටත්** උත්තර සපයන්න.
III. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80** කි.

01.(i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. (අ). සිංහල ජාතක කතාවන්ට නියමිත ආකෘතිය ලියා දක්වන්න.
(ආ). පන්සිය පනස් ජාතක පොත ලියැවුණේ කුමන රජ දවස ද ?

ii.(අ).ගුත්තිල කාව්‍යය රචනා වූයේ කුමන ගණයෙන් ද ?
(ආ).ගුත්තිල කාව්‍යය රචනා කරන ලෙස ආරාධනා කරන ලද්දේ කවුරුන් විසින් ද ?

iii. ''අවුරුදු දහයකින් මුළු ගම ම අලින්ට යනවා ට කිසි ම සැකයක් නැත"

(අ).මෙය කාගේ හැඟීමක් ද ?
(ආ).මෙම ප්‍රකාශයෙන් අදහස් වන්නේ කුමක් ද?

iv. ජාතිය රන් විමනක් වේ
ආගම මිණි පහනක් වේ
..................................
..................................

(අ). මෙම කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
(ආ). මෙහි දැක්වෙන කාව්‍යාලංකාරය ලියා දක්වන්න.

මෙම පිළිතුරු පත්‍රය www.learntv.lk වෙබ්අඩවිය මගින් 2020 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුදරුවන් සඳහා නොමිලේ බෙදා දීම සිදු කරන අතර වෙබ් අඩවි සංස්කාරකගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණ පිළිතුරු පත්‍රයම හෝ ඉන් කොටසක් වෙනත් වෙබ්අඩවියක එළ කිරීම, විකිණීම, මුදලට ලබාදීම වාණිජ පරමාර්ථයෙන් බෙදා හැරීම බුද්ධිමය දේපළ පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි.
මේ පිළිබදව විමසීම සඳහා h.d.hasarali@dharmavahini.tv/ info@learntv.lkයන විද්‍යුත් ලිපිනය මගින් හෝ 076-6566588 දුරකථන අංකය මගින් විමසීම් සිදු කළ හැක.

v. (අ)."ගංගාවේ සංගීතය" කවි පෙළෙහි රචකයා කවුරුන් ද ?

(ආ). ඔහු හැඳින්වූ ප්‍රකට නාමය කුමක් ද?

vi. (අ). 'සිංහබාහු' නාට්‍ය අයත් වන නාට්‍ය සම්ප්‍රදාය නම් කරන්න.

(ආ). එම නාට්‍යයට තේමා වී ඇති කතා පුවත කුමක් ද?

vii.(අ)."අඟුල්මල් දමනය" උපුටා ගත් ග්‍රන්ථය කුමක් ද?

(ආ). මෙම කතා වස්තුවෙන් ප්‍රකට කරවන බුදු ගුණය නම් කරන්න?

viii. "අපටත් රක්ෂාව නම් උඹ ම වෙ ද?"

(අ). මෙම ප්‍රකාශය උපුටා ගෙන ඇත්තේ කුමන පාඩමෙන් ද?

(ආ). මෙහි සඳහන් "උඹ" යන කවරෙක් ද?

(xi) පැසෙයි නිබැඳ සුවඳැල් කෙත් වත් අවට
ඇසෙයි ළමා වසුපැටියන් හඬ දුරට
දිසෙයි වෙහෙර එහි සුරවිමනක් ලෙසට
රසෙයි අමා රසමය ඒ පියසද දුට

(අ). මෙම කවියේ දැක්වෙන උපමාව උපුටා දක්වන්න.

(ආ). එම කවියෙන් වර්ණනාවකට ලක් කරන විහාරයේ නම කුමක් ද?

(x) පහත සඳහන් කෘතිවල කතුවරුන් නම් කරන්න.

(අ). බුත්සරණ.

(ආ).කුස ජාතක කාව්‍යය.

(ලකුණු 02×10=20යි)

මෙම පිළිතුරු පත්‍රය www.learntv.lk වෙබ්අඩවිය මගින් 2020 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුදරුවන් සඳහා නොමිලේ බෙදා දීම සිදු කරන අතර වෙබ් අඩවි සංස්කාරකගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණ පිළිතුරු පත්‍රයම හෝ ඉන් කොටසක් වෙනත් වෙබ්අඩවියක එල කිරීම, විකිණීම, මුදලට ලබාදීම වාණිජ පරමාර්ථයෙන් බෙදා හැරීම බුද්ධිමය දේපළ පනත යටතේ දඩුවම් ලැබිය හැකි වරදකි.
මේ පිළිබඳව විමසීම සඳහා h.d.hasarali@dharmavahini.tv/ info@learntv.lkයන විද්‍යුත් ලිපිනය මගින් හෝ 076-6566588 දුරකථන අංකය මගින් විමසීම් සිදු කළ හැක.

02). පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

i. පඤ්චාල දේශ වාසී වූ බ්‍රහ්මදත්ත රජ තෙමේ එක් සියයක් රාජධානියෙහි සියලු අටළොස් අක්ෂෞහිණියක් පමණ සේනාව හා සමග ආයේ ය. පඤ්චාල රාජධානිය සන්තක වූ මේ සේනා තොමෝ මෙතෙකැ යි පමණ නැත්තී ය.

(අ).මෙම ප්‍රකාශය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ආ)."අටළොස් අක්ෂෞහිණියක්" යන පදයෙහි අදහස ලියන්න.

ii. ගසට කෙටුම ගස මුල පෑයුමෙන් දැනේ
මිනිහා නොමිනිහා යන කඩිසරෙන් දැනේ
**අමුතු බත් දීම** අත ඇල්ලුමෙන් දැනේ
හානා හීය පානා **අඬහැරෙන්** දැනේ

(අ).මෙම කවියෙන් ලබා දෙන උපදෙසක් ලියා දක්වන්න.

(ආ).තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

iii. හිරිමල් සිනා රැළි පෙණ පිඬු මිහිරි තම
ගල් පරවල ම හැපි හැපි බිහි කරමි මම
සම තැනිතලාවල හමු වෙයි අලස කම
නිරසයි අතරමඟ අවහිර නුදුටු බිම

(අ).මෙම කවියේ අවසාන කවි පද දෙකේ අදහස ලියා දක්වන්න.

(ආ).කවියේ ඇති කාව්‍යෝපක්‍රම 2ක් ලියා දක්වන්න.

iv. ''කනේ කරේ දා ගන්න මොකුත් ම නැතිකම ගැන යි මං මේ දවස් ටිකේ ම කල්පනා කර කර හිටියෙ. මේක මගේ හිතට ලොකු අමාරුවක්. අඳින්න ආබරණයක් මැණික් ගලක් කියලා මොකුත් ම දෙයක් ඇත්තේ නෑ''.

(අ).මෙම ප්‍රකාශය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ආ).මෙය අසා සිටි පුද්ගලයා මේ සඳහා ලබා දුන් විසඳුම කුමක් ද ?

LearnTV

මෙම පිළිතුරු පත්‍රය www.learntv.lk වෙබ්අඩවිය මගින් 2020 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුදරුවන් සඳහා නොමිලේ බෙදා දීම සිදු කරන අතර වෙබ් අඩවි සංස්කාරකගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණ පිළිතුරු පත්‍රයම හෝ ඉන් කොටසක් වෙනත් වෙබ්අඩවියක එල කිරීම, විකිණීම, මුදලට ලබාදීම වාණිජ පරමාර්ථයෙන් බෙදා හැරීම බුද්ධිමය දේපළ පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි.
මේ පිළිබඳව විමසීම සඳහා h.d.hasarali@dharmavahini.tv/ info@learntv.lkයන විද්‍යුත් ලිපිනය මගින් හෝ 076-6566588 දුරකථන අංකය මගින් විමසීම් සිදු කළ හැක.

v. ඔය **දෑල** දොඩමලු ය,

සුවඳ බැරුවා ඉන්ට

**නිල් වතුර** තුරුලු කර

කෙසේ අතහැර යම් ද?

කෙකටියා පඳුර සුදු මල් පොකුර වඩාගෙන්

සොඳුර, නුඹ වාගේ ම හිනැහේය මා එක්ක

(අ).මෙහි සඳහන් පරිදි පරිසරයේ සිදුව ඇති වෙනස්කම් 2ක් ලියන්න.

(ආ).තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ලකුණු 04×05=20යි)

03) i.සිංහබාහු නුතන පරම්පරාවේ සිතුම් පැතුම් ද

ii.සිංහයා සාම්ප්‍රදායික පරම්පරාවේ සිතුම් පැතුම් ද,

නියෝජනය කරමින් පරම්පරා දෙකක ගැටුම සිංහබාහු නාට්‍යයෙන් නිරූපණය වේ. එක් කරුණකට නිදසුන් දෙක බැගින් දෙමින් විමසන්න.

නැතහොත්

"දෑතේ කරගැට සිඹ සනසන්නට" කවි පෙළ තුළින්

i.ජාතිකාභිමානයත්

ii.ශ්‍රමාභිමානයත්

ඉස්මතු කරවන අයුරු එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න.

04) i.දියමන්ති මාලය නැති වීමට පෙර

ii.දියමන්ති මාලය නැති වූ පසු

මැටිල්ඩාගේ චරිතයේ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ නිර්දිෂ්ට කොටස තුළින් එක් කරුණකට නිදසුන් දෙක බැගින් දක්වමින් විමසන්න.

මෙම පිළිතුරු පත්‍රය www.learntv.lk වෙබ්අඩවිය මගින් 2020 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුදරුවන් සඳහා නොමිලේ බෙදා දීම සිදු කරන අතර වෙබ් අඩවි සංස්කාරකගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණ පිළිතුරු පත්‍රයම හෝ ඉන් කොටසක් වෙනත් වෙබ්අඩවියක එල කිරීම, විකිණීම, මුදලට ලබාදීම වාණිජ පරමාර්ථයෙන් බෙදා හැරීම බුද්ධිමය දේපළ පනත යටතේ දඩුවම් ලැබිය හැකි වරදකි.
මේ පිළිබඳව විමසීම සඳහා h.d.hasarali@dharmavahini.tv/ info@learntv.lkයන විද්‍යුත් ලිපිනය මගින් හෝ 076-6566588 දුරකථන අංකය මගින් විමසීම් සිදු කළ හැක.

Learn TV
Learn TV

නැතහොත්

සිරි රහල් හිමියන්

i.අර්ථ රසයත්

ii.ශබ්ද රසයත්

මනාව සංකලනය කරමින් චමත්කාර ජනක පරිසරයක් සැළලිහිණියා වෙත සමීප කරවයි.එක් කරුණකට නිදසුන් දෙක බැගින් දෙමින් විමසන්න.

05). වෑත්තෑවේ හිමියන්ගේ ප්‍රතිභාපූර්ණ කවීත්වය ගුත්තිල කාව්‍යයෙන් මනාව නිරූපණය වේ. නිර්දිෂ්ට කොටසින් උදාහරණ තුනක්වත් දක්වමින් විස්තර කරන්න.

06). අමාවතුර කෘතියෙහි භාෂා ශෛලිය ගුරුළුගෝමී පඬිතුමාට ආවේණික වූ ප්‍රාණවත් භාෂා ශෛලියකි. **"අඟුල්මල් දමනය"** නිර්දිෂ්ට කොටස තුළින් උදාහරණ තුනක්වත් දක්වමින් විස්තර කරන්න.

07). කුරක්කන් වගාවේදී ගොවියා මුහුණ දුන් විවිධ අභියෝග ජය ගැනීමට ඔහු දැරූ වෙහෙස කුරහන් කවි මගින් නිරූපණය වේ. නිර්දිෂ්ට කොටස තුළින් උදාහරණ තුනක්වත් දෙමින් විස්තර කරන්න.

මෙම පිළිතුරු පත්‍රය www.learntv.lk වෙබ්අඩවිය මගින් 2020 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුදරුවන් සඳහා නොමිලේ බෙදා දීම සිදු කරන අතර වෙබ් අඩවි සංස්කාරකගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණ පිළිතුරු පත්‍රයම හෝ ඉන් කොටසක් වෙනත් වෙබ්අඩවියක එල කිරීම, විකිණීම, මුදලට ලබාදීම වාණිජ පරමාර්ථයෙන් බෙදා හැරීම බුද්ධිමය දේපළ පනත යටතේ දඩුවම් ලැබිය හැකි වරදකි.
මේ පිළිබඳව විමසීම සඳහා h.d.hasarali@dharmavahini.tv/ info@learntv.lkයන විද්‍යුත් ලිපිනය මගින් හෝ 076-6566588 දුරකථන අංකය මගින් විමසීම් සිදු කළ හැක.